# කර්මාන්ත

## සමස්ත උපනතීන්

1990 වසරේදී සිත්ගන්නා සුළු ප්‍රසාරණයක් වාර්තා කළ කර්මාන්ත අංශය, 1991 වසරේ දී තරමක මධ්‍යස්ථ වර්ධනයක් පෙන්නුම් කරන ලදී. 1990 දී මූර්ත වශයෙන් සියයට 14 කින් ඉහළ නැගුණු කාර්මික නිමැවුම 1991 දී තවදුරටත් සියයට 10 කින් ප්‍රසාරණය විය. මෙම වර්ධනය මුළුමනින්ම වාර්තා වූයේ පෞද්ගලික අංශයේ කර්මාන්ත වලිනි. පෞද්ගලික අංශයේ කර්මාන්ත නිමැවුම සියයට 14 කින් වැඩි වූ අතර, රාජ්‍ය අංශයේ එම නිමැවුම සියයට 8 කින් පහත වැටුණි.

පෞද්ගලික අංශය තුළ විශාල වර්ධනයක් වාර්තා කළ කාර්මික උප අංශයන් වූයේ: රෙදිපිළි සහ ඇඳුම් පැළඳුම්, ආහාර, පාන වර්ග සහ දුම්කොළ; රසායනික ද්‍රව්‍ය සහ සකස් කළ ලෝහ නිෂ්පාදිත යන අංශයන්ය. 1991 රාජ්‍ය අංශයේ කාර්මික නිමැවුමෙහි වූ තියුණු පහත වැටීමට හේතු වූයේ ලංකා ඛනිජ තෙල්, ජාතික පේෂකර්ම සහ ලංකා පිහන් සංස්ථාව වැනි රාජ්‍ය අංශයේ වැදගත් ව්‍යවසායයන් ගණනාවකම නිෂ්පාදනය අඩු වීමය.

කාර්මික අපනයනයන්හි වටිනාකම 1990 දී රුපියල් දශ ලක්ෂ 41,510 සිට 1991 දී රුපියල් දශ ලක්ෂ 50,736 දක්වා ඉහළ ගියේය. මුළු අපනයන ඉපැයුම් තුළ අන්තර්ගත කාර්මික අපනයනයන්හි සාපේක්ෂ කොටස 1990 දී සියයට 52 සිට 1991 දී සියයට 60 දක්වා වැඩි විය. නිමි ඇඳුම් සහ ඛනිජ තෙල් නිෂ්පාදිත, කාර්මික අපනයනයන්හි ප්‍රමුඛත්වය ලබාගත් අතර, එහි වටිනාකම මුළු කාර්මික අපනයන වටිනාකමෙන් සියයට 73 ක් විය. රටේ කර්මාන්ත පදනම ශක්තිමත් කිරීම සඳහා නිෂ්පාදිත හා අපනයන ව්‍යුහය වඩා වැඩි එකතු කළ අගයක් සහිත නිෂ්පාදනයන් වෙතට මාරු කිරීමේ අවශ්‍යතාවය මෙමගින් පෙන්නුම් කරයි.

## කාර්මික ප්‍රතිපත්තිය

කර්මාන්ත, විද්‍යාකටයුතු හා තාක්ෂණ අමාත්‍යාංශය මගින් හඳුන්වා දුන් නව කාර්මික උපාය මාර්ගයන් ක්‍රියාත්මක කිරීම සඳහා 1991 වර්ෂයේදී පියවර ගන්නා ලදී. 1990 දෙසැම්බර් 6 දින පාර්ලිමේන්තුව මගින් සම්මත කරන ලද 1990 අංක 46 දරන කර්මාන්ත ප්‍රවර්ධන පනත 1991 ජනවාරි මස 1 දින සිට ක්‍රියාත්මක කරන ලද අතර අන්තර් ආයතන සම්බන්ධීකරණය සඳහා ඇතිකරන ලද කර්මාන්ත කොමිසම ජනවාරි මස සිට කටයුතු ආරම්භ කරන ලදී. කර්මාන්ත සඳහා උපදේශක සභාවක් සහ ප්‍රාදේශීය කර්මාන්ත සේවා කමිටු පත් කිරීමට අවශ්‍ය රෙගුලාසි 1991 අග භාගයේදී ප්‍රකාශයට පත් කරන ලදී. රටෙහි අඩු දියුණු ප්‍රදේශයන් සංවර්ධනය කිරීමේ අරමුණින් තුන්වන ආයෝජන ප්‍රවර්ධන කලාපය 1991 ජූනි මස දී දකුණු පළාතේ කොග්ගල ආරම්භ කෙරුණි. රජයේ පෞද්ගලීකරණ ප්‍රතිපත්තිය අනුව 1991 වසර තුළදී,ලංකා වානේ, ශ්‍රී ලංකා සිමෙන්ති, සෙවනගල, හිඟුරාණ සහ කන්තලේ සීනි සමාගම් සහ ශ්‍රී ලංකා (ලංකා) රබර් නිෂ්පාදන සමාගම යන රාජ්‍ය ව්‍යවසායයන් පෞද්ගලීකරණය කිරීම සඳහා අමාත්‍ය මණ්ඩලය විසින් අනුමැතිය දෙන ලදී. එසේම රාජ්‍ය ව්‍යවසායයන් ගණනාවක්ම සීමිත සමාගම් බවට පරිවර්තනය කිරීම සඳහා ද මෙම වසර තුළදී අනුමැතිය දෙන ලදී. ලංකා තුනීලැලි, ජාතික කඩදාසි, පරන්තන් කෙමිකල්ස්, ලංකා පිහන්, ලංකා ලුණු, බෝගල මිනිරන්, කහටගහ මිනිරන් සහ ලංකා ඛනිජ වැලි යන ආයතන මේ අතර වේ. ලංකා ඔක්සිජන් සහ පූගොඩ රෙදිපිළි යන සමාගම්වල පිළිවෙලින් රුපියල් දශ ලක්ෂ 27 හා රුපියල් දශ ලක්ෂ 30 ක් වටිනා කොටස් මහජනතාවට 1991 වසර තුළදී නිකුත් කරන ලදී.

**නිෂ්පාදනය**

1991 වර්ෂයේදී කාර්මික නිමැවුම් වටිනාකම මූර්ත වශයෙන් සියයට 10 කින් වැඩි වී ඇතැයි ඇස්තමේන්තු කර ඇත. පෞද්ගලික අංශයේ සමස්ත කාර්මික නිෂ්පාදනය සියයට 14 ක වැඩිවීමක් වාර්තා කළ අතර, රාජ්‍ය අංශයේ කර්මාන්ත නිමැවුම් වටිනාකම සියයට 8 කින් පහත වැටුණි. ඛනිජ තෙල් නිෂ්පාදිත වටිනාකම බැහැර කළ විට, කාර්මික නිෂ්පාදන වටිනාකම සියයට 11 කින් ප්‍රසාරණය වී ඇතැයි ඇස්තමේන්තු කර ඇත.

1991 දී කාර්මික නිමැවුමේ වැඩිවීම් වාර්තා කළ කාර්මික උප අංශයන් වූයේ, මූලික ලෝහ නිෂ්පාදිත (සියයට 34), රෙදිපිළි, ඇඳුම් පැළඳුම් සහ සම් නිෂ්පාදිත (සියයට 16), කඩදාසි හා කඩදාසි නිෂ්පාදිත (සියයට 15), සකස් කළ ලෝහ (සියයට 14) සහ ආහාර, පාන වර්ග සහ දුම්කොළ (සියයට 8)වේ. නිමැවුමේ අඩුවීම් වාර්තා කළ කාර්මික උප අංශයයන් වූයේ රසායනික ද්‍රව්‍ය, ඛනිජ තෙල් සහ ප්ලාස්ටික් නිෂ්පාදිත (සියයට 3) සහ දැව හා දැව නිෂ්පාදිත (සියයට 2).

අපනයන ප්‍රවර්ධන කලාප තුළ සහ ඉන් පිටත වූ අපනයනාභිමුඛ ඇඟළුම් කර්මාන්තයේ ඇති වූ සීඝ්‍ර ප්‍රසාරණය මෙන්ම දේශීය වෙළෙඳ පොළට නැඹුරු වූ ඇඟළුම් කර්මාන්තයේ උසස් ක්‍රියාකාරිත්වය රෙදිපිළි, ඇඳුම් පැළඳුම් සහ සම් නිෂ්පාදිත කාර්මික ගණයෙහි නිෂ්පාදනය සැළකිය යුතු ලෙස වැඩි වීමට හේතු විය. පෞද්ගලික අංශයේ රෙදිපිළි සහ සම් නිෂ්පාදිත නිමැවුමද මෙම කාර්මික ගණයෙහි වැඩි දියුණු වූ ක්‍රියාකාරිත්වයට දායක විය. කෙසේ වුවද, රාජ්‍ය අංශයේ රෙදිපිළි, ඇඳුම් පැළඳුම් සහ සම් නිෂ්පාදිත කාර්මික ගණයෙහි නිෂ්පාදනය 1991 දී සියයට 30 කින් පහත වැටුණි. ආහාර, පාන වර්ග සහ දුම්කොළ කාර්මික ගණයට අයත් පෞද්ගලික අංශයේ කර්මාන්තවල නිමැවුමෙහි වැඩිවීමක් පෙන්විය. මෙයට විශාල වශයෙන් හේතු වූයේ සීනි, කිරි නිෂ්පාදන, කිරිඟු පිටි, මත්පැන් නිෂ්පාදන, දුම්කොළ, රසකැවිලි සහ මස් නිෂ්පාදිත වැනි නිෂ්පාදන කර්මාන්ත ගණනාවක නිෂ්පාදනය වැඩිවීමයි. කෙසේ වුවද, මෙම කාර්මික ගණයෙහි රාජ්‍ය අංශයේ නිෂ්පාදනය සියයට 19 කින් පහත වැටුණි.

රසායනික ද්‍රව්‍ය, ඛනිජ තෙල්, ගල්අඟුරු, රබර් සහ ප්ලාස්ටික් නිෂ්පාදිත කාර්මික ගණයට අයත් සබන් සහ සුවඳ විලවුන්, ඖෂධ වර්ග, රබර් සහ ප්ලාස්ටික් භාණ්ඩ නිෂ්පාදනයෙහි යෙදී සිටි පෞද්ගලික අංශයේ කර්මාන්ත ප්‍රධාන වශයෙන් ඉහළ නිෂ්පාදන මට්ටම් වාර්තා කරන ලදී. කෙසේ වුවද, ලංකා ඛනිජ තෙල් සංස්ථාවේ නිෂ්පාදනය පහත වැටීම නිසා මෙම කාර්මික ගණයට රාජ්‍ය අංශයෙන් සිදු වූ දායකත්වය විශාල වශයෙන් පහත වැටුණි.

සකස් කළ ලෝහ නිෂ්පාදිත කාර්මික ගණයෙහි නිෂ්පාදනය ඉහළ යෑමට ප්‍රධාන වශයෙන් හේතු වූයේ විද්‍යුත් උපකරණ, ප්‍රවාහන උපකරණ, සකස් කළ ලෝහ, කේබල් සහ ශීතකරණ වැනි පෞද්ගලික අංශයේ කර්මාන්ත කිහිපයක නිෂ්පාදනය වැඩිවීමය. වානේ සංස්ථාවේ නිෂ්පාදනය වැඩිවීම නිසා මූලික ලෝහ නිෂ්පාදිත කාර්මික ගණයෙහි ඉහළ නිෂ්පාදන මට්ටමක් වාර්තා විය. මෙම කාර්මික ගණයෙහි ද පෞද්ගලික අංශයේ නිෂ්පාදනය සියයට 16 කින් වැඩි විය. මෙම වැඩිවීම විශාල වශයෙන් ඇළුමිනියම් සහ ගැල්වනයිස් තහඩු නිමැවුම තුලින් පිළිබිඹු විය. ලෝහ නොවන ඛනිජ නිෂ්පාදිත ගණය තුළ නිමැවුමේ වැඩිවීම ප්‍රධාන වශයෙන් වාර්තා වූයේ පිඟන් භාණ්ඩ, සිමෙන්ති සහ වීදුරු භාණ්ඩ නිෂ්පාදනයේ නියැලුණු පෞද්ගලික අංශයේ කර්මාන්තවලය. ප්‍රධාන වශයෙන් ලංකා සිමෙන්ති සංස්ථාවේ වැඩි වූ නිෂ්පාදන මට්ටම නිසා මෙම කාර්මික ගණයෙහි රාජ්‍ය අංශයේ නිෂ්පාදනයෙහිද සුළු වැඩිවීමක් වාර්තා කළේය.

දැව හා දැව නිෂ්පාදිත කාර්මික ගණයෙහි පෞද්ගලික අංශය ඉහළ නිමැවුම් මට්ටමක් වාර්තා කළේය. කෙසේ වුවද, රාජ්‍ය දැව සහ ලංකා තුනී ලෑලි සංස්ථාවන්හි අඩු නිෂ්පාදන මට්ටම් හේතු කොට ගෙන රාජ්‍ය අංශයේ නිෂ්පාදනයෙහි තියුණු පහත වැටීමක් ඇති විය. කඩදාසි සහ කඩදාසි නිෂ්පාදිත කාර්මික ගණයෙහි ඉහළ නිෂ්පාදන මට්ටමක් වාර්තා වීමට ප්‍රධාන වශයෙන් හේතු වූයේ

ජාතික කඩදාසි සංස්ථාවේ නිෂ්පාදනයත් වැඩිවීමය. රැලි සහිත කාඩ්බෝඩ් ඇසුරුම්, ලේබල, ලියුම් කවර සහ මුද්‍රණ නිෂ්පාදන යන ඒවායේ සැළකිය යුතු ඉහළ නිෂ්පාදන මට්ටමක් පෞද්ගලික අංශයේ කර්මාන්ත වලින් වාර්තා විය.

පවත්නා මිල ගණන් අනුව 1991 දී කාර්මික නිෂ්පාදනයෙහි වටිනාකම සියයට 15 කින් වැඩි වූ බවට ඇස්තමේන්තු කර ඇත. මූලික ලෝහ නිෂ්පාදිත වටිනාකම සියයට 31 කින් ද, රෙදිපිළි, ඇඳුම් පැළඳුම් සහ සම් නිෂ්පාදිත සියයට 24 කින් ද, ආහාර, පාන වර්ග සහ දුම්කොළ සියයට 22 කින් ද, සකස් කළ ලෝහ නිෂ්පාදිත සියයට 21 කින් ද, කඩදාසි හා කඩදාසි නිෂ්පාදිත සියයට 18 කින් ද, දැව හා දැව නිෂ්පාදිත සහ ලෝහ නොවන ඛනිජ නිෂ්පාදිත සියයට 11 බැගින් ද වර්ධනය විය. කෙසේ වුවද, රසායනික ද්‍රව්‍ය, ඛනිජ තෙල්, ගල් අඟුරු, රබර් සහ ප්ලාස්ටික් නිෂ්පාදිත සියයට 4 කින් පහත වැටුණි.

**1.18 සංඛ්‍යා සටහන**

**කාර්මික නිෂ්පාදන වටිනාකම 1987 - 1991 (වර්තන මිළ අනුව)**

රුපියල් දශ ලක්ෂ

| කාර්මික ගණය | 1987 | 1988 | 1989* | 1990 | 1991(අ) |
|---|---|---|---|---|---|
| 1. ආහාර, පාන වර්ග සහ දුම්කොළ | 12,962 | 14,675 | 18,458 | 21,955 | 26,737 |
| 2. රෙදිපිළි,ඇඳුම් පැළඳුම් සහ සම් නිෂ්පාදිත | 15,428 | 18,166 | 22,073 | 27,930 | 34,611 |
| 3. දැව හා දැව නිෂ්පාදිත (ගෘහ භාණ්ඩ ඇතුළුව) | 677 | 640 | 667 | 721 | 802 |
| 4. කඩදාසි හා කඩදාසි නිෂ්පාදිත | 1,372 | 1,492 | 1,456 | 1,880 | 2,214 |
| 5. රසායනික ද්‍රව්‍ය, ඛනිජ තෙල්, ගල් අඟුරු, රබර් සහ ප්ලාස්ටික් නිෂ්පාදිත | 13,477 | 13,681 | 12,041 | 21,215 | 20,455 |
| 6. ලෝහ නොවන ඛනිජ නිෂ්පාදිත (ඛනිජ තෙල් සහ ගල් අඟුරු හැර) | 2,156 | 2,267 | 6,007 | 7,554 | 8,416 |
| 7. මූලික ලෝහ නිෂ්පාදිත | 307 | 487 | 792 | 1,006 | 1,319 |
| 8. සකස් කළ ලෝහ නිෂ්පාදිත, යන්ත්‍ර සූත්‍ර සහ ප්‍රවාහන උපකරණ | 2,006 | 2,477 | 3,182 | 4,199 | 5,093 |
| 9. අන් තැනක සඳහන් නොවූ නිෂ්පාදිත | 155 | 178 | 231 | 296 | 373 |
| එකතුව | 48,540 | 54,063 | 64,907 | 86,756 | 100,020 |

(අ)තාවකාලික
* සංශෝධිත


මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

## රාජ්‍ය අංශයේ කර්මාන්ත

1990 වසරේ දක්නට ලැබුණු සියයට 14 ක වර්ධනයට ප්‍රතිවිරුද්ධව 1991 වර්ෂයේදී රාජ්‍ය අංශයේ කාර්මික නිමැවුම මූර්ත වශයෙන් සියයට 8 කින් පහත වැටුණි. රාජ්‍ය අංශයේ මුළු කාර්මික නිමැවුමෙන් සියයට 77 ක් පමණ දායකත්වය දරන ලංකා ඛනිජ තෙල් සහ ජාතික පේෂකර්ම යන සංස්ථාවන්හි නිමැවුමේ ඇති වූ විශාල පහත වැටීම නිසා රාජ්‍ය අංශයේ කාර්මික නිමැවුම තියුණු ලෙස පහත වැටුණි. ඛනිජ තෙල් නිෂ්පාදිත බැහැර කළ විට රාජ්‍ය අංශයේ කාර්මික නිමැවුම සියයට 7 කින් පහත වැටුණි.

වර්ෂය තුලදී රාජ්‍ය ව්‍යවසායයන් වැඩි සංඛ්‍යාවක් දුර්වල ක්‍රියාකාරිත්වයක් පෙන්නුම් කළේය. නිමැවුමේ පහත වැටීම් වාර්තා කළ රාජ්‍ය ව්‍යවසායයන් වූයේ: ලංකා සම්භාණ්ඩ නිෂ්පාදිත (සියයට 65), ලංකා ලෝහ හාඩ්වෙයාර් (සියයට 48), රාජ්‍ය දැව (සියයට 44), තෙල් හා මේද (සියයට 32), ජාතික පේෂකර්ම (සියයට 30), ජාතික ලුණු (සියයට 17), ශ්‍රී ලංකා සීනි (සියයට 15), ලංකා ඛනිජ වැලි (සියයට 12), රාජ්‍ය රබර් නිෂ්පාදන (සියයම 10), ලංකා ඛනිජ තෙල් (සියයට 9) සහ ලංකා සෙරමික් (සියයට 9) යන සංසථාවන්ය.

# රාජ්‍ය අංශයේ කර්මාන්ත නිමැවුම් දර්ශකය




ශ්‍රී ලංකා මහ බැංකුව.

**1.19 සංඛ්‍යා සටහන**

**රාජ්‍ය අංශයේ ප්‍රධාන කර්මාන්ත නිමැවුම් දර්ශකය 1989 - 1991**

**(1977 = 100)**

| කාර්මික ගණය | 1989 | 1990 | 1991(අ) |
|---|---|---|---|
| 1. ආහාර, පාන වර්ග සහ දුම්කොළ | 26.2 | 22.6 | 18.3 |
| 2. රෙදිපිළි, ඇඳුම් පැළඳුම් සහ සම් නිෂ්පාදිත | 173.8 | 96.0 | 67.0 |
| 2.1 රෙදිපිළි | 236.2 | 128.6 | 90.5 |
| 3. දැව හා දැව නිෂ්පාදිත | 28.9 | 27.4 | 12.3 |
| 4. කඩදාසි හා කඩදාසි නිෂ්පාදිත | 107.9 | 118.1 | 137.4 |
| 5. රසායනික නිෂ්පාදිත | 85.8 | 122.4 | 111.9 |
| 5.1 ඛනිජ තෙල් | 85.6 | 124.3 | 113.1 |
| 6. ලෝහ නොවන ඛනිජ නිෂ්පාදිත | 137.5 | 137.5 | 143.5 |
| 6.1 සිමෙන්ති | 164.8 | 156.6 | 171.4 |
| 7. මූලික ලෝහ නිෂ්පාදිත | 76.4 | 80.3 | 111.5 |
| 8. සකස් කළ ලෝහ නිෂ්පාදිත | 44.2 | 33.6 | 17.4 |
| සියළුම ගණයයන් | 89.3 | 100.0 | 91.6 |
| ඛනිජ තෙල් නිෂ්පාදිත හැර | 93.4 | 73.1 | 67.6 |

(අ) තාවකාලික

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

1991 ප්‍රථම කාර්තුවේ දී සති 4 ක් පමණ නඩත්තු කටයුතු සඳහා තෙල් පිරිපහදුව වසා තැබීම ලංකා ඛනිජ තෙල් සංස්ථාවේ නිමැවුම පහත වැටීමට ප්‍රධාන හේතුව විය. ජාතික ජේෂකර්ම සංස්ථාවේ නිමැවුම සියයට 30 කින් පහත වැටීමට මූලික හේතුව වූයේ පෙහෙකම්හල් දෙකක රාජ්‍ය අයිතිය (තුල්හිරිය සහ පූගොඩ) පෞද්ගලික අංශයට මාරු කිරීමය. ලංකා සම්භාණ්ඩ සංස්ථාවේ දුර්වල ක්‍රියාකාරිත්වයට වගකිවයුතු ප්‍රධාන හේතුව 1991 මැයි මාසයේ සිට නිෂ්පාදන කටයුතු අත්හිටුවීමය.

දැව කැපීමේ කටයුතු අඩු මට්ටමක පැවතීමේ ප්‍රතිඵලයක් ලෙස රාජ්‍ය දැව සංස්ථාවේ නිමැවුම පහත වැටුණි. පෞද්ගලීකරණය කිරීමට අවශ්‍ය මූලික කටයුතු පිළියෙල කිරීම සඳහා සීමාසහිත තෙල් හා මේද සමාගමේ නිෂ්පාදන කටයුතු 1991 ජූලි සිට අත්හිටුවීම නිසා එහි නිමැවුමේ තියුණු පහත වැටීමක් ඇති විය. වර්ෂය තුළදී අමුද්‍රව්‍ය සැපයුමේ අඩුවීම නිසා ලංකා ලෝහ හාඩ්වෙයාර් සමාගමේ නිමැවුම පහත වැටුණි. ජාතික ලුණු සංස්ථාවේ නිෂ්පාදන මට්ටම පහත වැටීමට ප්‍රධාන හේතුව වූයේ පුත්තලම සහ අලිමංකඩ ලුණු ලේවායයන්හි නිමැවුම පහත වැටීමය. සීමාසහිත ශ්‍රී ලංකා සීනි සමාගමේ නිමැවුම පහත වැටීමට ප්‍රධාන හේතුව වූයේ කන්තලේ, හිඟුරාණ සහ සෙවනගල කර්මාන්ත ශාලාවලට උක්දඬු සැපයීම අඩුවීමය. කර්මාන්තශාලා ප්‍රදේශවල විදුලිබල සැපයීමට ඇතිවූ බාධාවන් සහ නොකඩවා පැවති සිවිල් කලබල ලංකා ඛණිජ වැලි සංස්ථාවේ නිමැවුම කෙරෙහි අහිතකර ලෙස බලපෑවේය.

වර්ෂය තුළදී නිෂ්පාදන වැඩිවීම් වාර්තා කළ රාජ්‍ය ව්‍යවසායයන් වූයේ ස්කාගාර සමාගම (සියයට 57), ලංකා වානේ (සියයට 39), ජාතික කඩදාසි (සියයට 16), ශ්‍රී ලංකා සිමෙන්ති (සියයට 9) සහ රාජ්‍ය පතල් හා කැනීම් සංවර්ධන (සියයට 6)යන සංසථාවන්ය.

රාජ්‍ය ව්‍යවසායයන්හි ආංශික වර්ගීකරණය අනුව මූලික ලෝහ නිෂ්පාදිත අංශය ඉහළම වර්ධනයක් (සියයට 39) 1991 දී වාර්තා කළේය. ලෝහ නොවන ඛනිජ නිෂ්පාදිත (සියයට 4) සහ කඩදාසි හා කඩදාසි නිෂ්පාදිත (සියයට 16) යන අංශ නිෂ්පාදන මට්ටම්වල ඉහළ වැඩිවීම් වාර්තා කළ අනෙකුත් අංශයන් විය. නිෂ්පාදන මට්ටම්වල පහත වැටීම් වාර්තා කළ අංශයයන් අතර, දැව

හා දැව නිෂ්පාදිත (සියයට 54), සකස් කළ ලෝහ නිෂ්පාදිත (සියයට 48), රෙදිපිළි, ඇඳුම් පැළඳුම් හා සම් නිෂ්පාදිත (සියයට 30), ආහාර, පාන වර්ග සහ දුම්කොළ (සියයට 19) සහ රසායනික නිෂ්පාදිත (සියයට 9).

**1.20 සංඛ්‍යා සටහන**

**කාර්මික ව්‍යවසායයන්ට කරන ලද රාජ්‍ය අරමුදල් සංක්‍රාම 1989 - 1991**

රුපියල් දශ ලක්ෂ

| සංස්ථාව/ව්‍යවසායය | ප්‍රාග්ධන | | | වර්තන | | | එකතුව | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | 1989 | 1990 | 1991(අ) | 1989 | 1990 | 1991(අ) | 1989 | 1990 | 1991(අ) |
| 1. ශ්‍රී ලංකා සීනි සංයුක්ත මණ්ඩලය | 107.0 | 68.6 | - | 225.0 | - | - | 332.0 | 68.6 | - |
| 2. රාජ්‍ය පොහොර සංස්ථාව | 3.0 | - | - | - | - | - | 3.0 | - | - |
| 3. ජාතික පේෂ කර්ම සංස්ථාව | 42.0 | 42.0 | 42.0 | - | - | - | 42.0 | 42.0 | 42.0 |
| 4. ලංකා තෙල් හා මේද සංයුක්ත මණ්ඩලය | - | - | - | 5.6 | - | - | 5.6 | - | - |
| එකතුව | 152.0 | 110.6 | 42.0 | 230.6 | - | - | 382.6 | 110.6 | 42.0 |

(අ) අනුමත ඇස්තමේන්තුව

මූලය: මහ භාණ්ඩාගාරය

පසුගිය වර්ෂය හා සැසඳීමේදී 1991 දී සියයට 62 ක පහත වැටීමක් වාර්තා කරමින් රුපියල් දශ ලක්ෂ 42 ක මුළු අයවැය සංක්‍රාම ප්‍රමාණයක් රාජ්‍ය අංශයේ කාර්මික ව්‍යවසායයන්ට ලබාදෙන ලදී. මෙම ප්‍රමාණය මුළුමනින්ම ප්‍රාග්ධන සංක්‍රාම වශයෙන් ජාතික පේෂකර්ම සංස්ථාව විසින් ලබා ගන්නා ලදී.

## බලය සහ ඉන්ධන

ලංකා විදුලිබල මණ්ඩලයට කරන ලද විකිණීම් අත්හලව්ට 1991 වසරේදී කර්මාන්තයන්ට අලෙවි කරන ලද ඉන්ධන වටිනාකම සියයට 31 කින් වැඩිවිය. 1991 දී බැර ඩීසල් අලෙවිය සියයට 62 කින් ද උදුන් තෙල් අලෙවිය සියයට 27 කින් ද වැඩි විය.

1991 වර්ෂයේදී කර්මාන්ත අංශයේ විදුලිබල භාවිතය සියයට 5 කින් වර්ධනය විය. මෙය කුඩා පරිමාණ කර්මාන්තයන්හි සියයට 21 ක, මධ්‍යම පරිමාණ කර්මාන්තයන්හි සියයට 3 ක සහ විශාල කර්මාන්තයන්හි සියයට 6 ක යන වර්ධනයන්හි සංකලනයකි.

## කර්මාන්තවලට පහසුකම්

1991 වර්ෂය තුලදී ද කර්මාන්ත අංශයට සහනදායී කොන්දේසි මත මූල්‍යමය ආධාර නොකඩවා ලැබුණි. ශ්‍රී ලංකා මහ බැංකුවේ මැදි හා දිගුකාලීන ණය අරමුදල (මැ.දි.ණ.අ.) සහ ජාතික සංවර්ධන බැංකුවේ සුළු හා මධ්‍යම පරිමාණ කර්මාන්ත ණය සහතික යෝජනා ක්‍රමය (සු.ම.ක.) කර්මාන්ත අංශයට මූල්‍යමය ආධාර සපයනු ලබන ප්‍රධාන ප්‍රතිමූල්‍ය වැඩපිළිවෙලවල් දෙක ලෙස ක්‍රියාත්මක විය. මෙයට අමතරව ලංකා සංවර්ධන මූල්‍ය සමායතනය (ලං.සං.මූ.ස.), ජාතික සංවර්ධන බැංකුව (ජා.සං.බැ.) සහ වාණිජ බැංකු කර්මාන්තකරුවන් සඳහා ණය සහ ප්‍රාග්ධන සහභාගිත්වය තුලින් සෘජු මූල්‍ය පහසුකම් සපයන ලදී.

**1.21 සංඛ්‍යා සටහන**

**කර්මාන්තයන්හි බලය හා ඉන්ධන භාවිතය 1990 - 1991**

| අයිතමය | 1990(ආ) | 1991(අ) |
|---|---|---|
| 1. විදුලි බලය (ගිග වොට් පැය) (ඇ) | 909.5 | 958.6 |
| 1.1 කුඩා කර්මාන්ත | 55.3 | 67.0 |
| 1.2 මධ්‍යම කර්මාන්ත | 498.7 | 513.7 |
| 1.3 විශාල කර්මාන්ත | 355.5 | 377.9 |
| 2. කාර්මික ඉන්ධනවල දේශීය අලෙවිය (මෙ. ටො. දහස්) (ඈ) | 180.5 | 236.8 |
| 2.1 බැර ඩීසල් | 20.1 | 32.5 |
| 2.2 උදුන් තෙල් | 160.4 | 204.3 |

මූලයන්: ලංකා විදුලි බල මණ්ඩලය,
ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව

(අ) තාවකාලික
(ආ) සංශෝධිත
(ඇ) නිමැවුම් හා අපනයන සැකසුම් කර්මාන්තද ඇතුළත්ය. කිලෝ වෝල්ට් ඇම්පියර් 50 ට අඩු ධාරිතාවයකින් යුත් කුඩා කර්මාන්ත වශයෙන්ද, කිලෝ වෝල්ට් ඇම්පියර් 50-500 අතරට ගැණෙන ඒවා මධ්‍යම කර්මාන්ත වශයෙන්ද, කිලෝ වෝල්ට් ඇම්පියර් 500 ට වැඩි ඒවා විශාල කර්මාන්ත වශයෙන්ද නිර්වචනය කෙරේ.
(ඈ) ලංකා විදුලි බල මණ්ඩලය හැර සෙසු ආයතනවලට කෙරුණු විකිණීම්.

අපනයන සංවර්ධන මණ්ඩලයේ සහ වාණිජ බැංකුවල සහභාගිත්වයෙන් ශ්‍රී ලංකා මහ බැංකුවේ මධ්‍යම හා දිගු කාලීන ණය අරමුදල 1991 වර්ෂය තුළදී ද අඛණ්ඩව ක්‍රියාත්මක විය. දුර්වල කර්මාන්ත සඳහා පහසුකම් සැපයීම තියුණු ලෙස පහත වැටීම හේතුවෙන් මහ බැංකුවේ මධ්‍යම හා දිගු කාලීන ණය අරමුදල යටතේ අනුමත කළ ප්‍රතිමූල්‍ය පහසුකම් වල සැළකිය යුතු අඩුවීමක් 1991 වර්ෂය තුලදී පෙන්නුම් කරනු ලැබිණි. දුර්වල කර්මාන්ත සඳහා විශේෂ ප්‍රතිමූල්‍ය පහසුකම් සහ ප්‍රතිමූල්‍ය ගණයයන් ii, iii, iv යටතේ පසුගිය වර්ෂයේ සපයන ලද රුපියල් දශ ලක්ෂ 908 හා සසඳන කල 1991 වර්ෂයේදී සපයන ලද මුළු ප්‍රතිමූල්‍ය පහසුකම් ප්‍රමාණය රුපියල් දශ ලක්ෂ 237 ක් විය.

ශ්‍රී ලංකා මහ බැංකුව 1991 දෙසැම්බර් අවසානය වන විට රුපියල් දශ ලක්ෂ 2,555 ක ණය මුදල් ආවරණය වන පරිදි කුඩා පරිමාණයේ කර්මාන්ත සහ සුළු හා මධ්‍යම පරිමාණයේ කර්මාන්ත (සු.ම.ක.) 1, 11, 111 වෙනුවෙන් සුරැකුම් 8,851 ක් නිකුත් කර තිබුණි. වසර අවසානය වන විට රුපියල් දශ ලක්ෂ 448 ක වටිනාකමින් යුත් ණයකර 2,556 ක් සම්පූර්ණයෙන් අයකරගෙන තිබුණි. නොපියවූ ම් ණය සලකා බලන කල ප්‍රදානය කරන ලද ණය 1,382 ක් වෙනුවෙන් රුපියල් දශ ලක්ෂ 233 ක් හිඟව පැවතිණ. 1991 අවසානය වන විට මහ බැංකුව විසින් හිමිකම් පෑම් 392 ක් පියවීම සඳහා රුපියල් දශ ලක්ෂ 44 ක මුදලක් ගෙවා තිබුණි.

ජාතික සංවර්ධන බැංකුව (ජා.සං.බැ.) ණය සහ ප්‍රාග්ධන සහභාගිත්වය තුලින් කාර්මික ව්‍යාපෘතීන් සඳහා ඍජු මූල්‍යාධාර සැපයීය. 1990 දී රුපියල් දශ ලක්ෂ 1,938 ක ඍජු මූල්‍යාධාර සපයමින් අනුමත කරන ලද ව්‍යාපෘතීන් 140 හා සසඳන කල ජා.සං.බැ. විසින් 1991 දී රුපියල් දශ ලක්ෂ 2,771 ඍජු මූල්‍යාධාර ඇතුලත් ව්‍යාපෘතීන් 213 ක් සඳහා අනුමැතිය දී ඇත. මෙම මූල්‍යමය පහසුකම් වලින් ප්‍රධාන කොටසක් ලබාගත් කාර්මික ගණයයන් වූයේ ආහාර, පාන වර්ග හා දුම්කොළ, මූලික ලෝහ නිෂ්පාදිත හා ඇඳුම් පැළඳුම් සහ සම් නිෂ්පාදිත යනාදියයි.

ලංකා සංවර්ධන මූල්‍ය සමායතනය කර්මාන්ත අංශය සඳහා ණය සහ ප්‍රාග්ධන සහභාගිත්වය වශයෙන් රුපියල් දශ ලක්ෂ 1,744 ක වටිනාකමක් සහිත ව්‍යාපෘතීන් 333 ක් සඳහා අනුමැතිය දෙන ලදී. මෙම මූල්‍යමය පහසුකම් වලින් ප්‍රධාන කොටසක් ලබාගත් කාර්මික ගණයයන් වූයේ ආහාර, පාන වර්ග හා දුම්කොළ, රසායනික ද්‍රව්‍ය, ඛනිජ තෙල්, ගල් අඟුරු, රබර් හා ප්ලාස්ටික් නිෂ්පාදිත, ඇඳුම් පැළඳුම් හා සම් නිෂ්පාදිත සහ සකස් කළ ලෝහ නිෂ්පාදිත යනාදියයි.

## 1.22 සංඛ්‍යා සටහන

### 1991 ජාතික සංවර්ධන බැංකුව විසින් සැපයීමට අනුමැතිය දී ඇති ප්‍රතිමූල්‍ය සහ මූල්‍ය පහසුකම්

| කාර්මික ගණය | ප්‍රතිමූල්‍ය අනුමත කිරීම සු. ම. ක. III යෝජනා ක්‍රමය | | සෘජු මූල්‍ය පහසුකම් | | එකතුව | |
|---|---|---|---|---|---|---|
| | සංඛ්‍යාව | වටිනාකම රුපියල් දශ ලක්ෂ | සංඛ්‍යාව | වටිනාකම රුපියල් දශ ලක්ෂ | සංඛ්‍යාව | වටිනාකම රුපියල් දශ ලක්ෂ |
| 1. ආහාර, පාන වර්ග සහ දුම්කොළ | 349 | 182.4 | 22 | 537.65 | 371 | 720.05 |
| 2. රෙදිපිළි, ඇඳුම් පැළඳුම් සහ සම් නිෂ්පාදිත | 220 | 130.7 | 38 | 376.74 | 258 | 507.44 |
| 3. දැව හා දැව නිෂ්පාදිත (ගෘහ භාණ්ඩ ඇතුළුව) | 89 | 34.1 | 6 | 10.06 | 95 | 44.16 |
| 4. කඩදාසි හා කඩදාසි නිෂ්පාදිත | 53 | 44.6 | 2 | 12.80 | 55 | 57.40 |
| 5. රසායනික ද්‍රව්‍ය, ඛනිජ තෙල් ගල් අඟුරු, රබර් සහ ප්ලාස්ටික් නිෂ්පාදිත | 74 | 74.1 | 19 | 193.43 | 93 | 267.53 |
| 6. ලෝහ නොවන ඛනිජ නිෂ්පාදිත (ඛනිජ තෙල් සහ ගල් අඟුරු හැර) | 75 | 25.7 | - | - | 75 | 25.70 |
| 7. මූලික ලෝහ නිෂ්පාදිත | 138 | 51.1 | 40 | 442.99 | 178 | 494.09 |
| 8. සකස් කළ ලෝහ නිෂ්පාදිත, යන්ත්‍ර සූත්‍ර සහ ප්‍රවාහන උපකරණ | - | - | - | - | - | - |
| 9. අන් තැනක සඳහන් නොවූ නිෂ්පාදිත | 504 | 215.3 | 86 | 1,197.60 | 590 | 1,412.90 |
| එකතුව | 1,502 | 758.0 | 213 | 2,771.27 | 1,715 | 3,529.27 |

මූලය: ජාතික සංවර්ධන බැංකුව

වාණිජ බැංකු මගින් කර්මාන්ත අංශය සඳහා මූල්‍යාමය පහසුකම් සැපයීම 1991 වර්ෂයේදී ද නොකඩවා කර ගෙන යනු ලැබිණි. කාර්මික කටයුතු සඳහා සැපයුණු වාණිජ බැංකු අත්තිකාරම් (ඉංජිනේරු, ගොඩනැගිලි තැනීම් සහ කැණීම් හැර) 1991 සැප්තැම්බර් අග වන විට රුපියල් දශ ලක්ෂ 14,513 ක් විය.

## පෞද්ගලික විදේශ ආයෝජනය

මහ කොළඹ ආර්ථික කොමිසම (ම.කො.ආ.කො.) "ඒකීය ආයෝජන ප්‍රවර්ධන මධ්‍යස්ථානයක්" ලෙස ක්‍රියා කරමින් 1991 වර්ෂය තුළදී ව්‍යාපෘතීන් 74 ක් "ම.කො.ආ.කො. තත්ත්වය" යටතේ අනුමත කරන ලද අතර වර්ෂය අවසාන වන විට අනුමත කළ මුළු ව්‍යාපෘතීන් සංඛ්‍යාව 411 දක්වා වැඩිවිය. මෙයින් ව්‍යවසායයන් 246 ක් විවිධ කර්මාන්තයන් ආරම්භ කිරීම සඳහා ම.කො.ආ.කො. සමඟ ගිවිසුම් ඇති කර ගන්නා ලද ඒවා විය. 1991 වර්ෂය අවසාන වන විට, වාණිජමය නිෂ්පාදන කටයුතුවල නියැලුණු ව්‍යවසායයන්ගේ සංඛ්‍යාව 153 ක් විය. නිෂ්පාදන කටයුතු ආරම්භ කර තිබූ ව්‍යාපෘතීන් අතරින් 72 ක් කටුනායක ආයෝජන ප්‍රවර්ධන කලාපය (ක.ආ.ප්‍ර.ක.) තුළ ද, 28 ක් බියගම ආයෝජන ප්‍රවර්ධන කලාපය (බි.ආ.ප්‍ර.ක.) තුළ ද, 2 ක් කොග්ගල ආයෝජන ප්‍රවර්ධන

කලාපය (කො.ආ.ප්‍ර.ක.) තුළ සහ ඉතිරි 51 දිවයිනේ සෙසු පලාත්වල ද පිහිටා තිබුණි.

1991 අවසානය වන විට මහ කොළඹ ආර්ථික කොමිසම යටතේ ඇති ව්‍යවසායයන්හි නියුතු මුළු සේවක සංඛ්‍යාව 85,457 ක් වූ අතර 1991 වසරේ එහි වර්ධනය සියයට 20 ක් විය. මෙම සංඛ්‍යාවෙන් 56,825 ක් හෙවත් සියයට 66 ක් රෙදිපිළි, ඇඳුම් පැළඳුම් සහ සම් නිෂ්පාදන අංශයේ යෙදී සිටියහ. එසේ වුවද මෙම අංශයේ සේවා නියුක්තිය මහ කොළඹ ආර්ථික කොමිසම යටතේ ඇති ව්‍යවසායයන්ගේ මුළු සේවක සංඛ්‍යාවෙන් 1990 වසරේ දී සියයට 70 සිට1991 වසරේදී සියයට 66 දක්වා අඩුවිය. රැකියා උත්පාදනයේ ඉහළ අනුපාතයන් වාර්තා කරන ලද්දේ රසායනික ද්‍රව්‍ය, ඛනිජ තෙල්, ගල් අඟුරු, රබර් සහ ප්ලාස්ටික් නිෂ්පාදිත සහ ආහාර, පාන වර්ග සහ දුම්කොළ නිෂ්පාදිත යන කාර්මික ගණයයන්හිය.

1991 මහ කොළඹ ආර්ථික කොමිසමෙහි ව්‍යවසායයන්හි දළ අපනයන ඉපැයුම් වල වටිනාකම රුපියල් දශ ලක්ෂ 22,093 ක් (වි.ගැ.හි දශ ලක්ෂ 390) වූ අතර, එය පසුගිය වර්ෂයට වඩා සියයට 26 ක වැඩිවීමකි. වි.ගැ.හි වටිනාකම අනුව මෙම වර්ධනය සියයට 21 කි. 1990 වර්ෂයට වඩා මෙම වර්ෂයෙහි සියයට 24 කින් වැඩි වූ රෙදිපිළි සහ ඇඟළුම් අංශයේ අපනයන ඉපැයුම්, මහ කොළඹ ආර්ථික කොමිසමෙහි ව්‍යවසායයන්ගේ මුළු අපනයන ඉපැයුම් වලින් සියයට 65 ක් හිමිකර ගනිමින් ප්‍රධාන අපනයන ඉපැයුම්කරු ලෙස අඛණ්ඩව පැවතිණි. රෙදිපිළි සහ ඇඟළුම් අංශයේ එක් සේවකයෙකු වෙනුවෙන් වූ අපනයන ඉපැයුම් වටිනාකම ඉකුත් වසරේ රුපියල් 235,528 ක් ව පැවති අතර1991 වසරේදී එය රුපියල් 267,108 ක් විය. විමසුමට ලක්කෙරෙන වසර තුලදී ඇඟළුම් නොවන ව්‍යවසායයන්හි අපනයන ඉපැයුම් සියයට 30 කින් වැඩි විය.

### 1.23 සංඛ්‍යා සටහන

**අයෝජන ප්‍රවර්ධන කලාපය - සේවා නියුක්තිය සහ අපනයන ඉපැයුම් 1990 - 1991**

| කාර්මික ගණය | 1990 | | 1991(අ) | |
|---|---|---|---|---|
| | සේවා නියුක්තිය (දෙසැම්බර් අවසානයට සංඛ්‍යාව) | දළ අපනයන ඉපැයුම් (නැ. වි. ස.) රු. දශ ලක්ෂ | සේවා නියුක්තිය (දෙසැම්බර් අවසානයට සංඛ්‍යාව) | දළ අපනයන ඉපැයුම් (නැ. වි. ස.) රු. දශ ලක්ෂ |
| 1. ආහාර, පාන වර්ග සහ දුම්කොළ | 1,633 | 849 | 2,168 | 1,235 |
| 2. රෙදිපිළි, ඇඳුම් පැළඳුම් සහ සම් නිෂ්පාදිත | 49,554 | 11,669 | 54,214 | 14,481 |
| 3. දැව හා දැව නිෂ්පාදිත (ගෘහ භාණ්ඩ ඇතුළුව) | 44 | 6 | 52 | 10 |
| 4. රසායනික ද්‍රව්‍ය, ඛනිජ තෙල්, ගල් අඟුරු රබර් සහ ප්ලාස්ටික් නිෂ්පාදිත | 2,765 | 503 | 5,390 | 1,088 |
| 5. ලෝහ නොවන ඛනිජ නිෂ්පාදිත (ඛනිජ තෙල් සහ ගල් අඟුරු හැර) | 5,502 | 1,811 | 6,069 | 1,871 |
| 6. සකස් කළ ලෝහ නිෂ්පාදිත, යන්ත්‍ර සූත්‍ර සහ ප්‍රවාහන උපකරණ | 1,436 | 750 | 1,465 | 686 |
| 7. අන් තැනක සඳහන් නොවූ නිෂ්පාදිත | 6,024 | 1,213 | 11,182 | 1,778 |
| 8. සේවා (ආ) | 4,400 | 724 | 4,917 | 944 |
| එකතුව | 71,358 | 17,525 | 85,457 | 22,093 |

(අ) තාවකාලික
(ආ) "එයාර් ලංකා" හැර

මූලය: මහ කොළඹ ආර්ථික කොමිසම

1991 දී මහ කොළඹ ආර්ථික කොමිසමේ අනුමත කළ ව්‍යාපෘතීන්ගේ අපේක්ෂිත මුළු අයෝජන ප්‍රමාණය රුපියල් දශ ලක්ෂ 8,070ක් වූ අතර ජපානය, හොංකොං, ඕස්ට්‍රේලියාව, දකුණු කොරියාව, ඕලන්දය සහ ඉන්දියාව වැනි රටවලින් විදේශ ආයෝජකයෝ පැමිණියහ. 1991 වසරේදී මහ කොළඹ ආර්ථික කොමිසම මගින් අනුමත කරන ලද ව්‍යාපෘතින්හි නිෂ්පාදිතයන් අතර හැඩගැන්වීමේ ආභරණ, කුඩා පිගන් ගඩොල් ප්‍රතිමා, කපා ඔප දැමූ දියමන්ති, විද්‍යුත් චුම්භක නිෂ්පාදන, පරිගණක සියුම් උපකරණ, කැබලි ලෝහ, වෘත්තීය නිල ඇඳුම්, ඇඟළුම්, රබර් සපත්තු, කෘතිම මල් වර්ග, ප්ලාස්ටික් භාණ්ඩ, කපන ලද මල් සහ පළතුරු, මුහුදු මාංශ ඇසුරුම් සහ සෙල්ලම් බඩු අන්තර්ගත වේ.

මහ කොළඹ ආර්ථික කොමිසම "විදේශ ආයෝජන ප්‍රවර්ධන කිරීමේ ඒකීය මධ්‍යස්ථානය" ලෙස ස්ථාපිත කිරීමෙන් අනතුරුව 1991 වර්ෂයේදී "විදේශ ආයෝජන උපදේශක කමිටු තත්ත්වයන් යටතේ" මහ කොළඹ ආර්ථික කොමිසමෙහි සහන නොලබන ව්‍යාපෘතීන් 105 ක් සඳහා අනුමැතිය දී ඇත. මෙම ව්‍යාපෘතීන් ගෙන් අපේක්ෂිත මුළු ආයෝජනය රුපියල් දශ ලක්ෂ 2,107 ක් වන අතර එහි විදේශීය ආයෝජන දයකත්වය රුපියල් දශ ලක්ෂ 843 සහ දේශීය ආයෝජන දායකත්වය රුපියල් දශ ලක්ෂ 1,254 ක් වේ. මෙම ව්‍යාපෘතිවලින් සේවා නියුක්තිය පුද්ගලයන් 7,161 ක් වේ.

මහ කොළඹ ආර්ථික කොමිසම 1991 වසර තුළදී සිංගප්පූරුවේ ආයෝජන ප්‍රවර්ධන කිරීමේ කාර්යයන්හි නිරත විය. ශ්‍රී ලංකාවේ විදේශ ආයෝජන ව්‍යාපෘතීන් පුළුල් පරාසයක ප්‍රවර්ධනය කිරීමේ අරමුණ ඇතිව එක්සත් ජාතීන්ගේ කාර්මික සංවර්ධන සංවිධානය සහ මහ කොළඹ ආර්ථික කොමිසම ඒකාබද්ධව සංවිධානය කරන ලද "ශ්‍රී ලංකා ආයෝජන පිළිබඳ සම්මන්ත්‍රණය" නොවැම්බර් 4දා සිට 7 දක්වා කොළඹ දී පැවැත්විය.